අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : 35/2025

මගේ අංකය : ED/04/59/08/01/01-2026
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.
2025. 11. 20.

**සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්**
**සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්**
සියලුම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්

## ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය - 2026

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල, ගුරු මධ්‍යස්ථානයන්හි සේවය කරන ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධරයන් සඳහා මෙම ස්ථාන මාරු පරිපාටිය මින් ඉදිරියට ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව ස්ථාන මාරු සිදු කරන ආකාරය පහත සඳහන් කර ඇති පරිදි වේ.

I. වාර්ෂික ස්ථාන මාරු
II. සේවා අවශ්‍යතාව මත කරනු ලබන ස්ථාන මාරු
III. විනය හේතු මත කරනු ලබන ස්ථාන මාරු
IV. රජයේ නිලධරයන්ගේ ඉල්ලීම මත කරනු ලබන අන්‍යෝන්‍ය ස්ථාන මාරු (සුහද මාරු)

2. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත්වන නිලධාරීන් පිළිබඳ විස්තර

2.1 දැනට සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I,II සහ III ශ්‍රේණියේ සියලුම නිලධාරීන් (ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපති, උප පීඨාධිපති හා ගුරු විද්‍යාල විදුහල්පති තනතුරු දරන නිලධාරීන් ද ඇතුළත්ව) අතුරින් වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත්වන නිලධරයන්

(අ) යම් සේවා ස්ථානයක අඛණ්ඩව වසර 08 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියලුම නිලධාරීන් ස්ථාන මාරු ඉල්ලුම් කර නොතිබුණ ද ස්ථාන මාරුවීම්වලට යටත් වනු ඇත.

(ආ) I. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපති, උප පීඨාධිපති හා ගුරු විද්‍යාල විදුහල්පති තනතුරු දරන නිලධාරීන් විධිමත් පත්වීම් ලද තනතුරේ අවම වශයෙන් වසර 05ක් වත් සේවය කර තිබීම ස්ථාන මාරුවක් සඳහා අයදුම් කිරීමට සුදුසුකමක් වේ.

II. ඉහත 2.1 (ආ) I යටතේ සඳහන් නොවන අනෙකුත් ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක හෝ ගුරු විද්‍යාලයක හෝ ගුරු මධ්‍යස්ථානයක හෝ අවම වශයෙන් වසර 02ක් සේවය කර තිබීම ස්ථාන මාරුවීමක් සඳහා අයදුම් කිරීමට සුදුසුකමක් වේ.

2.2 වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් නොවන නිලධරයන්

(අ) නිලධරයකුගේ ඉල්ලීම හෝ වෙනත් විශේෂිත කරුණු (විනය හෝ සේවා අවශ්‍යතාව) මත හෝ නොවේ නම් සාමාන්‍ය වශයෙන් වයස අවුරුදු 55 ඉක්ම වූ නිලධරයකු පළාතෙන් පිටතට ස්ථාන මාරු කරනු නොලැබේ. එසේ වුවද සේවා අවශ්‍යතාවය අනුව පළාත තුළ ස්ථාන මාරුවලට යටත්ය. කෙසේ නමුත් විනය හේතු මත හෝ සේවා අවශ්‍යතාවය මත ගුරු ශිෂ්‍යයන්ගේ අභිවෘද්ධිය පෙරදැරි කරගෙන යම් නිලධාරියෙකු පළාතෙන් පිටතට වුව ද ස්ථාන මාරු කරනු ලැබිය හැක.

(ආ) වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට නියමිත වර්ෂයේ ජනවාරි 1 දිනට වයස අවුරුදු 58 ඉක්ම වූ නිලධරයකු ඔහුගේ/ඇයගේ ඉල්ලීමක් නොවන කල්හි පළාත තුළ වුවද ස්ථාන මාරු කරනු නොලැබේ.

3. වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලයේ සංයුතිය

(I) අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) - සභාපති

(II) ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) - සාමාජික

(III) සහකාර ලේකම් (ගුරු අධ්‍යාපනඥ) - සාමාජික

(IV) 15%ක නිලධාරි නියෝජනය ඇති සෑම ගුරු අධ්‍යාපනඥ වෘත්තීය සමිතියකින්ම නම් කළ නියෝජිතයකු

4. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව

ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවක් පිහිටුවිය යුතු අතර එමඟින් පහත කරුණු පරීක්ෂා කර තීරණ ලබාදෙනු ඇත.

(I) මෙම ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්

(II) නිලධරයන්ගේ ඉල්ලීම්වලට පටහැනි ලෙස කරන ලද මාරුවීම් (අයදුම්පතෙහි සඳහන් කර ඇති මනාප 1,2,3,4,5 යන සේවා ස්ථාන ලෙස සළකයි.)

(III) ස්ථාන මාරුවීම් අයදුම් කරන ලද දිනෙන් පසුව නිලධරයන්ට සිදු වූ හදිසි විපත් කරදර අසනීප වැනි සානුකම්පිත තත්ත්වයන් සහ වෙනත් පිළිගත හැකි ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කර ඇති ඉල්ලීම්.

4.1 වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය

(I) අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් - සභාපති

(II) ජොෂ්ඨ සහකාර ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) - සාමාජික

(III) ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) - සාමාජික

5. වාර්ෂික ස්ථාන මාරු ලබාදීමේ දී සැළකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු

5.1 වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී කාලය ගණනය කරනු ලබනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය.

5.2 ස්ථාන මාරු ඉල්ලුම් කිරීමේදී තමන් ස්ථාන මාරුවීමට කැමති ස්ථාන පහක් ප්‍රමුඛත්වය අනුව සඳහන් කරමින් නියමිත ආකෘතියෙන් (ආකෘති අංක 01 අනුව) ස්ථානමාරුවීම් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. එම ඉල්ලීම ප්‍රකාරව ඉල්ලා සිටිනු ලබන සේවා ස්ථානයට ස්ථාන මාරුවීම ලබාදීමට හැකි සෑම විටම උත්සහ දරන අතර ඉල්ලා ඇති ස්ථානයට මාරුවීම ලබාදීමට නොහැකි වන අවස්ථාවකදී මාරු මණ්ඩලයේ අභිමතය පරිදි ඔවුන්ට වෙනත් සුදුසු සේවා ස්ථානයක් ලබා දෙනු ඇත.

5.3 භාර්යාව සහ ස්වාමි පුරුෂයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුක්ත වේ නම් එම දෙදෙනාටම ඔවුන්ගේ ඉල්ලීම අනුව එකම ප්‍රදේශයක සේවය කරන්නට ඉඩ ලබාදීමට මාරු මණ්ඩල සෑම උත්සාහයක්ම දරනු ලැබේ.

5.4 ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශ ගතව සිටින අවස්ථාවන්හිදී පිළිගත හැකි කරුණු සහිතව තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් ද සමග ස්ථාන මාරු පිළිබඳ කරන ඉල්ලීම් සැලකිල්ලට ගනු ලැබේ.

5.5 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිළධාරීන්ගෙන් 15% නියෝජනයකින් සමන්විත වෘත්තීය සමිතියක මව් සංගමයේ සභාපති/ ලේකම්/ භාණ්ඩාගාරික හා මධ්‍යම විධායක මණ්ඩලයේ සභිකයින් ස්ථාන මාරු කරන්නේ නම් අදාළ වෘත්තීය සංගමයේ ලේකම්ගේ නිර්දේශය සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතුවලට බාධා නොවන ස්ථානයකට ස්ථාන

මාරු කළ යුතුය. ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7 වගන්තිය යටතේ වන අනුග්‍රහයන් ලබා ගැනීමට අපේක්ෂා කරන සියලුම වෘත්තීය සමිති තම වෘත්තීය සමිති නිලධරයන් පිළිබඳ විස්තර මෙම ලේඛනයේ 5:17 වගන්තිය ප්‍රකාරව අදාළ මාරුවීම් බලධාරියා වෙත ස්ථාන මාරු මණ්ඩල කටයුතු ආරම්භ කිරීමට අවම වශයෙන් මසකට පෙර ඉදිරිපත් කළ යුතු වේ.

5.6 ස්ථාන මාරු ඉල්ලුම් කරන ලද නිලධාරියා ඉගැන්වීම සිදු කරනු ලබන විෂයය හා ඒ සඳහා ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන)ගේ නිර්දේශ සලකා බැලීම සිදු කළ යුතුය.

5.7 යම් නිලධරයකුගේ කලත්‍රයා පොලීසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ සේවයේ නියුක්තව සිට උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරීවලදී ආබාධිත තත්ත්වයට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් කළ යුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම් අනුව පමණි. එසේම එවැනි නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් ඉල්ලීම් පිළිබඳව ප්‍රමුඛත්වය දැක්විය යුතු වේ.

5.8 ස්ථාන මාරු කමිටු නිර්දේශ මත නිලධරයන් මාරු කිරීමේදී විද්‍යාපීඨ/ගුරු මධ්‍යස්ථාන/ගුරු විද්‍යාල කාර්ය මණ්ඩලයේ කණිෂ්ඨ/ජ්‍යෙෂ්ඨතාවයේ සමබරතාවය රැකීමට ද හැමවිටම උත්සාහ කළ යුතුය. තවද මෙම නිලධාරීන් විද්‍යාපීඨයන්හි, ගුරු විද්‍යාලයන්හි සහ ගුරු මධ්‍යස්ථානයන්හි සේවය කර ඇති සේවා කාලය සලකා බැලිය යුතුය.

5.9 වාර්ෂික ස්ථාන මාරු පටිපාටියෙහි 2.1 ඡේදය යටතට ගැනෙන නිලධරයකු වෙනත් ස්ථානයකට මාරුවීමට ඉල්ලා ඇති විටක, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා එහි 2.2 ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති එම ස්ථානයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන් ඉන් පිටතට මාරු කළ හැක.

5.10 එක් සේවා ස්ථානයක වසර 8 ට වඩා සේවය කළ නිලධරයන්ගේ නාම ලේඛනයක් අදාළ ආකෘතියෙන් (ශ්‍රී ලං.ගු.අ.සේ./වා.ස.මා./02 අනුව) නිවැරදිව සම්පූර්ණ කර අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත වාර්ෂිකව ජූලි 31 දිනට පෙර අදාළ පීඨාධිපති/ගුරු විද්‍යාල විදුහල්පති/ ගුරු මධ්‍යස්ථාන කළමනාකරු විසින් එවිය යුතුය.

5.11 " සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත විධිමත්ව පත් කරනු ලැබූ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපති, උප පීඨාධිපති හා ගුරු විද්‍යාල විදුහල්පති තනතුරු දරන නිලධාරීන් ස්ථාන මාරු කරන විට ඔහුගේ / ඇයගේ අනුප්‍රාප්තිකයා විය යුත්තේ විධිමත් පරිදි උක්ත තනතුරක් සඳහා පත් වූ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරියකු පමණි. (ඔවුන් ස්ථාන මාරු වීමේ දී අදාළ තනතුරේ වැඩභාර ගැනීමෙන් පසුව, එම නිලධාරියා අදාළ තනතුරට පත් කිරීමේ ලිපියක් අධ්‍යාපන සේවා කමිටුව විසින් නිකුත් කරනු ඇත.)

(අ). සම්මුඛ පරීක්ෂණය අනුව සිදු කරනු ලබන තනතුරට පත්කිරීම්වලට අදාළව එම තනතුරුවල ඇතිවන පුරප්පාඩු සඳහා (විශ්‍රාම ගැනීම හෝ වෙනත් හේතු මත) ස්ථාන මාරු පරිපාටිය අනුව ස්ථාන මාරු කරනුයේ විධිමත් පරිදි සම්මුඛ පරීක්ෂණයක් මඟින් එම තනතුරු සඳහා තෝරාගෙන ඇති නිලධාරීන් පමණි. (සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරාගෙන නොමැති නිලධාරීයකු වාර්ෂික ස්ථාන මාරු යටතේ එවැනි පුරප්පාඩුවක් සඳහා ස්ථාන මාරු කරනු නොලැබේ.)

5.12 ස්ථාන මාරුවීම් ඉල්ලීමේ දී සහ අභියාචනා ඉදිරිපත් කිරීමේදී සළකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රය අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි.

5.13 සෑම නිලධරයෙක් පිළිබඳව නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය. සාවද්‍ය හෝ අසම්පූර්ණ තොරතුරු එවා ඇති බව හෙළි වුවහොත් ඒ පිළිබඳව අදාළ ආයතන ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස් කළ සහ හරි වැරදි පරීක්ෂා කළ නිලධරයන්ද වගකීමට බැඳී සිටින අතර ඔවුන්ට විරුද්ධව විනයානුකූල පියවර ගනු ලැබේ.

5.14 ස්ථාන මාරු මණ්ඩල මඟින් ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකිවන සේ මුදා හැරීමට අදාළ පීඨ/ආයතන ප්‍රධානීන් වගබලාගත යුතුය. මෙම විධිවිධාන වලට පටහැනිව කටයුතු කරන ආයතන ප්‍රධානීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

5.15 ස්ථාන මාරුවීම් ලැබූ නිළධාරීන්ට (අභියාචනා සළකා බැලීමෙන් පසු) ඔවුන්ගේ වැටුප් නව සේවා ස්ථානය වෙත යවනු ලබන අතර, ඉහත 5.14 අනුව මුදා නොහැර රඳවා ගන්නා නිළධාරීන්ට තවදුරටත් වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ඒ ඒ ආයතන ප්‍රධානීන් විසින් වගකීම භාර ගත යුතුය.

5.16 ස්ථාන මාරුවීම් ලැබේ යැයි අපේක්ෂා කරන නිලධරයන්ගේ රාජකාරි කටයුතු සඳහා කල් ඇතිව වෙනත් නිලධරයන් පුහුණු කර වාර්ෂික ස්ථාන මාරුවීම් නියමිත දිනට ක්‍රියාත්මක කරවීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතුය. මෙවැනි කරුණු සම්බන්ධයෙන් පසුව කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

5.17 ස්ථාන මාරුවීම් ලැබීමට ඉඩ ඇතැයි සිතන කිසියම් නිලධරයෙකු සේවා අවශ්‍යතාවය මත තවත් වර්ෂයක් තම ආයතනය තුළ රඳවා ගත යුතු යැයි ආයතන ප්‍රධානියා විසින් අදහස් කරන්නේ නම් පමණක්, නිර්දේශිත අයදුම්පත්‍ර යොමු කරන අවස්ථාවේදීම එම අවශ්‍යතාවය පිළිබඳ පැහැදිලි කර අදාළ ආයතන ප්‍රධානියාගේ පෞද්ගලික නිර්දේශය ඇතිව අධ්‍යාපන

ලේකම් වෙත තම ඉල්ලීම ඉදිරිපත් කළ යුතු වේ. ස්ථාන මාරු කමිටුව ඒ පිළිබඳ සැළකිළිමත්ව ක්‍රියා කරනු ඇත. එක් වර්ෂයක් මෙසේ රඳවාගත් නිලධරයෙකු සඳහා නැවත අවස්ථාවක් ලබා දෙනු නොලැබේ.

5.18 ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 01 ) හි 11 වගන්තියේ විධිවිධාන අදාළ වේ.

## 6. වාර්ෂික ස්ථාන මාරු කාල සටහන

| | කාර්යය | දිනය |
|---|---|---|
| 1. | වාර්ෂික ස්ථාන මාරු කමිටු පිහිටුවීම | 2025 නොවැම්බර් මස 10 දිනට පෙර |
| 2. | වාර්ෂික ස්ථාන මාරු දැන්වීම් නිකුත් කිරීම | 2025 නොවැම්බර් මස 30 වන දිනට පෙර |
| 3. | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ බලධාරියා වෙත ඉදිරිපත් කිරීම | 2025 දෙසැම්බර් මස 31 වන දිනට පෙර |
| 4. | අදාළ බලධාරියා විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාර දීම | 2026 ජනවාරි මස 15 වන දිනට පෙර |
| 5. | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාළ බලධාරියා වෙත ලිඛිතව භාරදීම | 2026 ජනවාරි 31 වන දිනට පෙර |
| 6. | යෝජිත ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම | 2026 පෙබරවාරි මස 15 වන දිනට පෙර |
| 7. | ස්ථාන මාරුවීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීමේ අවසන් දිනය | 2026 පෙබරවාරි මස 28 වන දිනට පෙර |
| 8. | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාල බලධාරියා වෙත ලිඛිතව භාර දීම. | 2026 මාර්තු මස 15 වන දිනට පෙර |
| 9. | අවසාන වාර්ෂික ස්ථාන මාරු වීම් නියෝග නිකුත් කිරීම | 2026 අප්‍රේල් මස 01 වන දිනට පෙර |
| 10. | වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක කිරීම | 2026 මැයි මස 01 වන දින සිට |

## 7. වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර

7.1 වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් දෙනු ලැබූ නියෝගයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය ආකෘති අංක 03 ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේය. තවද, තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලි වල සහතික කළ පිටපත් එම අභියාචනය සමඟ ඉදිරිපත් කිරීමටද, ඔහු/ඇය ක්‍රියා කළ යුතු වන්නේය.

7.2 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාළ සියලු ලිපි ගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදිය ද, ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශ ද සහිතව එම අභියාචනය ලැබී දින 15ක් ඇතුළත ඇමුණුම 04 ප්‍රකාරව රාජ්‍ය සේවා

කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාළ අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වග බලා ගත යුතු වන්නේය. එතකුදු වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව අභියාචනා අදාල ලිපිගොනු, ලිපි ලේඛන, වාර්තා, නිරීක්ෂණ හා නිර්දේශ සමග 2026 මාර්තු 15 දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

8. නිලධරයන්ගේ වගකීම

8.1 යම් වර්ෂයකදී ස්ථාන මාරුවීම්වලට යටත් වන නිලධාරීන් ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් නොකළේ වුවද එම නිලධාරීන් මෙම චක්‍රලේඛ විධිවිධාන යටතේ වාර්ෂික ස්ථාන මාරුවලට යටත් වේ.

8.2 වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලුම නිලධරයන් නියමිත දිනයේ දී නව රාජකාරි ස්ථානය වෙත සේවය සඳහා වාර්තා කිරීමට බැඳී සිටිති.

9. අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 257 හි I,II,III,IV,V,VI වගන්තිවල සඳහන් විධිවිධාන වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් බලපැවැත්වෙනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව නිකුත් කරනු ලැබේ.

නාලක කලුවැව
ලේකම්

# ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත - 2026

| තනතුර හා පන්තිය | | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා | |
|---|---|---|---|

## අ. පෞද්ගලික තොරතුරු

1. නිලධාරියාගේ සම්පූර්ණ නම : ....................................................................................................
2. මුලකුරු සමග නම : ....................................................................................................
3. මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්) : ....................................................................................................
4. උපන්දිනය : ....................................................................................................
5. වයස (2026/01/01 දිනට) : අවු ........... මාස ........... දින ...........
6. ජාතික හැඳුනුම්පත් අංකය : ....................................................................................................
7. ස්ත්‍රී / පුරුෂ භාවය : ....................................................................................................
8. ස්ථිර ලිපිනය : ....................................................................................................
9. තාවකාලික ලිපිනය : ....................................................................................................
10. පෞද්ගලික දුරකථන අංකය : ....................................................................................................
11. විවාහක/ අවිවාහක බව : ....................................................................................................
12. විවාහක නම්,
    12.1 කලත්‍රයාගේ නම : ....................................................................................................
    12.2 රැකියාව සහ සේවා ස්ථානය : ....................................................................................................
    12.3 දරුවන් පිළිබඳ විස්තර

| අනු අංකය | වයස | ඉගෙනුම ලබන පාසල හා ශ්‍රේණිය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

## ආ. සේවා තොරතුරු

13. දැනට සේවය කරන ස්ථානය : ....................................................................................................
14. එම සේවා ස්ථානයේ ලිපිනය : ....................................................................................................
15. රාජකාරි දුරකථන අංකය : ....................................................................................................
16. දැනට දරන තනතුර : ....................................................................................................

30. ස්ථාන මාරුව ඉල්ලා සිටින ස්ථාන

1. ..................................................................................................................................
2. ..................................................................................................................................
3. ..................................................................................................................................
4. ..................................................................................................................................
5. ..................................................................................................................................

31. ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය : ..........................................

......................................................

අයදුම්කරුගේ අත්සන

**ඇ. පීඨාධිපති/ කලාප අධ්‍යක්ෂගේ නිර්දේශය**

ඉහත නම සඳහන් නිලධාරියා/ නිලධාරිණියගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු සහිතව / රහිතව/ පසුව ලබා දීමේ පදනම මත නිර්දේශ කරමි.

.....................................

.....................................

දිනය

අත්සන
නිල මුද්‍රාව

**ඉ. ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) ගේ නිර්දේශය හෝ ගුරු විද්‍යාල/ ගුරු මධ්‍යස්ථාන සඳහා අධ්‍යාපන අධ්‍යක්ෂ (ගුරු අධ්‍යාපන පරිපාලන)ගේ නිර්දේශය**

ඉහත නම සඳහන් නිලධාරියා/ නිලධාරිනියගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු සහිතව / රහිතව/ පසුව ලබා දීමේ පදනම මත නිර්දේශ කරමි.

.....................................

.....................................

දිනය

අත්සන
නිල මුද්‍රාව

17. පත්වීම් ලිපියේ අංකය හා දිනය : ..............................................................................................

18. පත්වීම් විෂය සහ පත්වීම් මාධ්‍ය : ..............................................................................................

19. ස්ථිර කර තිබේද ? : ..............................................................................................

20. සේවා ස්ථානය පිහිටි පළාත : ..............................................................................................

21. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය :

22. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය : අවු ........... මාස ........... දින ...........

(2025.12.31 දිනට)

23. පූර්ව සේවා ස්ථාන

| අනු අංකය | සේවා ස්ථානය | සිට | දක්වා | කාල සීමාව | |
|---|---|---|---|---|---|
| | | | | අවුරුදු | මාස |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

24. පත්වීම් මාධ්‍ය : ..............................................................................................

25. පත්වීම් ලිපිය අනුව විෂය ක්ෂේත්‍රය : ..............................................................................................

26. දැනට තමා වගකීම් දරන විෂය ක්ෂේත්‍රය : ..............................................................................................

..............................................................................................

..............................................................................................

## ඇ. ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු

27. වර්තමාන සේවා ස්ථානයට පත්වී කොපමණ කාලයකට පසුව ඉල්ලුම් කරනු ලබන ස්ථාන මාරුවක්ද ?

: ..............................................................................................

28. ස්ථාන මාරු ඉල්ලීමට හේතු : ..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

(වෛද්‍ය හේතු මත කරන ඉල්ලීමක් නම් ඒ බව වෛද්‍ය සහතිකය මගින් සනාථ කළ යුතුය.)

29. විශේෂ හේතු ඇත්නම් : ..............................................................................................

Pආකෘති අංක 02

# 2026 වාර්ෂික ස්ථාන මාරු අභියාචනා අයදුම්පත්‍රය

(අ) නිලධාරියා/නිලධාරිනිය විසින් සම්පූර්ණ කළ යුතු වේ.

01. නිලධාරියා/නිලධාරිනියගේ

1.1. මුලකුරු සමග නම :- ..........................................................................................

1.2 තනතුර හා ශ්‍රේණිය :- ..........................................................................................

1.3 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ මුල් පත්වීම් දිනය :- ..............................................

1.4 එම පත්වීම් දිනයට අනුව වැඩ භාරගත් දිනය :- ..........................................................

1.5 පත්වීම් විෂය සහ පත්වීම් මාධ්‍ය : ..........................................................................

1.6 පදිංචි ලිපිනය :- ..................................................................................................

1.7 උපන් දිනය :- ......................................................................................................

02. නිලධාරියා/නිලධාරිනියගේ

2.1. වර්තමාන සේවා ස්ථානය :- ...................................................................................

2.2. එම සේවා ස්ථානයේ සේවයට වාර්තා කළ දිනය :- .....................................................

2.3 මුල් පත්වීම් දින සිට සේවය කර ඇති ස්ථාන හා කාල සීමාවන් පිළිබඳ විස්තර

| අනු අංකය | සේවා කාලය | | සේවා ස්ථානය |
|---|---|---|---|
| | සිට | දක්වා | |
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |

03. ස්ථාන මාරු පිළිබඳ විස්තර

3.1. ස්ථාන මාරුව ලැබී ඇති සේවා ස්ථානය :- ..............................................................

3.2. අභියාචනාව මගින් ඉල්ලුම් කරන සේවා ස්ථානය :- ....................................................

3.3. අභියාචනා කිරීමට හේතු :- ....................................................................................

..........................................................................................................................

..........................................................................................................................

දිනය ....................................

....................................................

නිලධාරියාගේ/ නිලධාරිනියගේ අත්සන

**(ආ) පීඨාධිපති/ කලාප අධ්‍යක්ෂගේ නිර්දේශය**

ඉහත නම සඳහන් නිලධාරියා/ නිලධාරිණියගේ ස්ථාන මාරු අභියාචනා පත්‍රය නිර්දේශ කරමි. / නිර්දේශ නොකරමි.

.................................... ....................................

දිනය අත්සන
නිල මුද්‍රාව

**(ඇ). ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) ගේ නිර්දේශය හෝ ගුරු විද්‍යාල/ ගුරු මධ්‍යස්ථාන සඳහා අධ්‍යාපන අධ්‍යක්ෂ (ගුරුඅධ්‍යාපන පරිපාලන) ගේ නිර්දේශය**

ඉහත නම සඳහන් නිලධාරියා/ නිලධාරිනියගේ ස්ථාන මාරු අභියාචනා පත්‍රය නිර්දේශ කරමි. / නිර්දේශ නොකරමි.

.................................... ....................................

දිනය අත්සන
නිල මුද්‍රාව

ශ්‍රී ලං.ගු.අ.සේ. වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ අභියාචනා - ආකෘති අංක 03

## 2026 වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම - අභියාචක පිළිබඳ තොරතුරු

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| 01. මුලකුරු සමග නම :- | | | |
| 02. තනතුර හා ශ්‍රේණිය | | | |
| 03. උපන්දිනය :- YYYY/MM/DD | 04. වයස :- (2026/01/01 දිනට) | 05. ජාතික හැඳුනුම්පත් අංකය :- | 06.ස්ත්‍රී / පුරුෂ භාවය :- |
| 07. ස්ථිර ලිපිනය :- | 08. තාවකාලික ලිපිනය :- | 09. දුරකථන අංකය<br>කාර්යාලය :-<br>පෞද්ගලික :- | |
| 10. විවාහක / අවිවාහක බව | 11. කලත්‍රයාගේ නම :- | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය :- | |
| 13. දරුවන් ගණන :- | 14. ඔවුන්ගේ වයස :- | 15. ඉගෙනුම ලබන පාසැල් :- | |

ආ. සේවා තොරතුරු

| | |
|---|---|
| 16. වර්තමාන තනතුරට පත්වූ දිනය :- | |
| 17. වර්තමාන සේවා ස්ථානය :- | 18. සේවා ස්ථානය පිහිටි නගරය :- |
| 19. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය :- YYYY/MM/DD | 20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය (2025.12.31 දිනට)<br>අවු....... මාස....... දින....... |
| 21. ප්‍රතිලාභ ලබන (ප්‍රියමනාප) සේවා ස්ථානයක / ස්ථානවල සේවය කර තිබේද? | |

| 22. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | | සේවා ස්ථානය | ප්‍රිය මනාප සේවා ස්ථානයකි/ ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයකි | සේවා කාලය | |
|---|---|---|---|---|---|
| | 1 | | | සිට | දක්වා |
| | 2 | | | | |
| | 3 | | | | |
| | 4 | | | | |
| | 5 | | | | |
| | 6 | | | | |

ඇ. ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු (අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න)

| | | | | |
|---|---|---|---|---|
| 23 | වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර | ඇත | | ස්ථාන මාරු අයදුම් කර ඇත්නම් අයදුම් කර ඇති සේවා ස්ථාන<br>1.<br>2.<br>3.<br>4.<br>5. |
| | | නැත | | |
| ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය | | | | |

24. ස්ථාන මාරු චක්‍රය සමන්විත වන නිලධාරීන් ගණන ...............................

| | | |
|---|---|---|
| 25. ස්ථාන මාරු සමාලෝචන කමිටුවට අයදුම් කර | ඇත | |
| | නැත | |

26. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම පිළිබඳ තොරතුරු

| | | |
|---|---|---|
| ස්ථාන මාරුව අවලංගු කිරීම | | ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ ඉල්ලුම් කල සේවා ස්ථාන<br>01 ....................................................................<br>02 ....................................................................<br>03 .................................................................... |
| සංශෝධනය කිරීම | | |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | |

| |
|---|
| 27. ස්ථානමාරු සමාලෝචන කමිටු තීරණය |

28. ස්ථානමාරු සමාලෝචන කමිටු තීරණයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................

29. ඉහත හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධකවල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.

ඇමුණුම (01) ..........................................................................................

ඇමුණුම (02) ..........................................................................................

ඇමුණුම (03) ..........................................................................................

30. ඉල්ලා සිටිනු ලබන සහන

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

.............................  ...................................

දිනය  අත්සන

ඇ. අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

නිලධාරියා/ නිලධාරිනිය විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තොරතුරු ඔහුගේ/ ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව සහතික කරමි. 2025 වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන අභියාචනය නිර්දේශ කරමි/ පහත සඳහන් හේතු මත නිර්දේශ නොකරමි.

I. ..................................................................................................................

II. ..................................................................................................................

III. ..................................................................................................................

.................................... ....................................

දිනය අත්සන

ඉ. ස්ථාන මාරු බලධරයාගේ නිර්දේශය

I. ස්ථාන මාරු චක්‍රය සම්බන්ධ වන නිලධාරීන් ගණන : ................................................

II. අභියාචනය පිළිබඳ නිර්දේශය : ..........................................................................

..................................................................................................................

.................................... ....................................

දිනය අත්සන

ශ්‍රී ලං.ගු.අ.සේ. වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ අභියාචනා - ආකෘති අංක **04**

## **2026** වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම - අනුප්‍රාප්තික නිලධාරියා පිළිබඳ තොරතුරු

I. අභියාචක නිලධාරියාගේ නම හා තනතුර :

..................................................................................................

II. අභියාචක නිලධාරියාට අදාල අනුප්‍රාප්තික නිලධාරියා පිළිබඳ තොරතුරු

අ. පෞද්ගලික තොරතුරු

<table>
<tr><td>01. මුලකුරු සමග නම :-</td><td colspan="3"></td></tr>
<tr><td>02. තනතුර හා ශ්‍රේණිය</td><td colspan="3"></td></tr>
<tr><td>03. උපන්දිනය :-<br>YYYY/MM/DD</td><td>04. වයස :-<br>(2026/01/01 දිනට)</td><td>05. ජාතික හැඳුනුම්පත් අංකය :-</td><td>06. ස්ත්‍රී / පුරුෂ භාවය :-</td></tr>
<tr><td>07. ස්ථිර ලිපිනය :-</td><td>08. තාවකාලික ලිපිනය :-</td><td colspan="2">09. දුරකථන අංකය<br>කාර්යාලය :-<br>පෞද්ගලික :-</td></tr>
<tr><td>10. විවාහක / අවිවාහක බව</td><td>11. කලත්‍රයාගේ නම :-</td><td colspan="2">12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය :-</td></tr>
<tr><td>13. දරුවන් ගණන :-</td><td>14. ඔවුන්ගේ වයස :-</td><td colspan="2">15. ඉගෙනුම ලබන පාසැල් :-</td></tr>
</table>

ආ. සේවා තොරතුරු

<table>
<tr><td colspan="6">16. තනතුරට පත්වූ දිනය :-</td></tr>
<tr><td colspan="3">17. වර්තමාන සේවා ස්ථානය :-</td><td colspan="3">18. සේවා ස්ථානය පිහිටි නගරය :-</td></tr>
<tr><td colspan="3">19. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය :-<br>YYYY/MM/DD</td><td colspan="3">20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය (2025.12.31 දිනට)<br>අවු....... මාස....... දින.......</td></tr>
<tr><td colspan="6">21. ප්‍රතිලාභ ලබන (ප්‍රියමනාප) සේවා ස්ථානයක / ස්ථානවල සේවය කර තිබේද?</td></tr>
<tr><td rowspan="8">22. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන</td><td colspan="2">සේවා ස්ථානය</td><td rowspan="2">ප්‍රිය මනාප සේවා ස්ථානයකි/ ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයකි</td><td colspan="2">සේවා කාලය</td></tr>
<tr><td colspan="2"></td><td>සිට</td><td>දක්වා</td></tr>
<tr><td>1</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>2</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>3</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>4</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>5</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>6</td><td></td><td></td><td></td><td></td></tr>
</table>

ඇ. ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු (අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න)

| | | | | |
|---|---|---|---|---|
| 23 | වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර | ඇත | | ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ ඉල්ලුම් කල සේවා ස්ථාන<br>1.<br>2.<br>3. |
| | | නැත | | |
| ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය | | | | |

| | | |
|---|---|---|
| 24. ස්ථාන මාරු සමාලෝචන කමිටුවට අයදුම් කර | ඇත | |
| | නැත | |

25. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම

| | | |
|---|---|---|
| ස්ථාන මාරුව අවලංගු කිරීම | | ස්ථාන මාරුව සංශෝධනය කල යුතු/ නව ස්ථාන මාරුවීමක් ලබා දිය යුතු සේවා ස්ථාන<br>01 ................................................................<br>02 ................................................................<br>03 ................................................................ |
| සංශෝධනය කිරීම | | |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | |

| |
|---|
| 26. ස්ථානමාරු සමාලෝචන කමිටු තීරණය |

27. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර තිබේද / නැද්ද යන්න

..........................................................................................................................................

28. අභියාචකගේ ඉල්ලීම ඉටුකළහොත් අනුප්‍රාප්තික නිලධරයාට අගතියක් නොවන පරිදි ස්ථාන මාරු චක්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශ :

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

දිනය .............................                                                  ...................................

අත්සන